[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]



# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | විෂයය - ඉතිහාසය | පත්‍රය II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ..........................................................................

**II පත්‍රය**

- **I කොටසේ ප්‍රශ්න අංක 01) අනිවාර්ය වේ.**
- **II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6 කි.**

**I කොටස**

01) (අ).I.පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

යාන් ඔය, ඉරණමඩු ජලාශය ,කලාවැව කොළඹ ,පඬුවස්නුවර, කයිට්ස් දූපත,මන්නාරම් දූපත ලංකාපටුන,පොලොන්නරුව, හලාවත ,ඉබ්බන්කටුව සෙන්කඩගල.

II.පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ලකුණු කරන්න.
කල්කටා, මලක්කා සමුද්‍ර සන්ධිය, පෘතුගාලය, කොන්ස්තන්තිනෝපලය, ජාවා දූපත,කොරියානු අර්ධද්වීපය.


ආ) I.පහත A,B,C,D යනුවෙන් දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

A.නිසි කලට සී සෑම නොකරන පුද්ගලයින්ට දඩයක් නියම කරමින් පිහිටුවන ලද ටැම් ලිපිය-
B.විශාල මැටිබඳුන් ළිඳ තුළට බස්සවා බිත්ති ආවරණය කොට සකස් කරන ලද ළිං-
C.පොන්නම්බලම් අරුණාචලම් මහතා විසින් ප්‍රථම වරට සභාපතිත්වය දැරූ සංගමය-
D.සපුමල් කුමරු කෝට්ටේ රාජ්‍යත්වයට පත් වූ පසු හැඳින්වූ නම-

පහත A හා B යටතේ දක්වා ඇති පින්තූර කොටස් අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.



II)
1.A ඡායාරූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2.මෙම නිර්මාණය දැකිය හැකි රාජධානිය කුමක්ද?
3.මෙම නිර්මාණය කිරීමට භාවිත කළ මාධ්‍යය කුමක්ද?
4.මෙය කිනම් ආගමකට අයත් වේ ද?



III)

1.B ඡායාරූපයෙන් දැක්වෙනපුද්ගලයා කවුරුන්ද?

2.මෙතුමා සාමාජිකත්වය දැරූ විධායක කාරක සභාව කුමක්ද?

3.මෙතුමා ගේ නායකත්වයෙන් පිහිට වූ දේශපාලන පක්ෂය කුමක් ද?

4.මෙතුමා ආරම්භ කරන ලද පළමුවන බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය කුමක්ද?

**II කොටස**

2)

I.ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ එළිමහන් වාසස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 3)

II.ප්‍රාග් ඓතිහාසික මානවයා තම වාසස්ථාන තෝරා ගැනීමේදී අවධානය යොමු කරන ලද කරුණු දෙකක් ලියන්න. (ලකුණු 4)

III.පූර්ව ඓතිහාසික යුගයේ මානවයා භාවිත කළ තාක්ෂණය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 5)

IV.මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 6)

3)

I.පහත සඳහන් ගංගා නිම්නවල පිහිටුවා ඇති පාලන මධ්‍යස්ථාන A,B,C අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A.කිරිඳි ඔය

B.මල්වතු ඔය

C.මහවැලි ගඟ (ලකුණු 3)

II.පහත A,B,C හා D වලින් දැක්වෙන පැරණි තාක්ෂණය හා සම්බන්ධ නිර්මාණ මොනවාදැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න.

A.මැටි බඳුන් සැකසීම සඳහා යොදාගත් තාක්ෂණික උපාංගය

B.පීඩන ශල්කනය යොදාගනිමින් තැනූ මෙවලම් විශේෂය.

C.ජල තරංගවලින් ඇතිවන පීඩන බලය නිසා වැව් බැම්ම ඛාදනය වීම වැළැක්වීමට ඉදිකර තිබෙන ව්‍යුහය.

D.රුවන්වැලි මහා සෑය අකුණු පහරින් ආරක්ෂා කිරීමට යොදාගත් උපකරණය.

(වජුවුම්බට, ජ්‍යාමිතික, ශුද්‍ර මෙවලම්, සොරොච්චි, රළපනාව, සකපෝරුව, පිටවාන, කටාරම, බෝධිසර)

(ලකුණු 4)

III.අතීත ශ්‍රී ලංකාවේ මහා වැව් ඉදිකිරීමේ අරමුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

IV.

A - පිටවාන

B - සොරොච්චි

C - බිසෝකොටුව

D - වැව් බැම්ම යන වැවක දක්නට ලැබෙන තාක්ෂණික අංග අතරින් දෙකක නිර්මාණය හා කාර්යය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 6)

4)

I.අතීතයේ රටේ ප්‍රධාන පාලකයා බවට පත්වන රජතුමාගෙන් ජනතාව අපේක්ෂා කළ ප්‍රධාන යුතුකම් තුනක් නම් කරන්න. (ලකුණු 3)

II.අතීත ජනතාව වැව් පද්ධතියක් (එල්ලංගාව) සැදීම තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂා කළ ප්‍රධාන අරමුණු දෙකක් නම් කරන්න. (ලකුණු 4)

III.මෙරට දේශපාලන බලය මධ්‍යගත කිරීම සඳහා දේවානම්පියතිස්ස රජු ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 5)

IV.මෙරට එක්සේසත් කිරීමට I වන විජයබාහු රජතුමාගෙන් ඉටු වූ සේවය විස්තර කරන්න. (ලකුණු 6)

5)

I.මහනුවර රාජධානිය හැඳින්වීමට භාවිත කළ වෙනත් නම් තුනක් ලියන්න. (ලකුණු 3)

II.පහත A සිට B දක්වා ඇති ප්‍රකාශ සඳහා අදාළ තොරතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

A . සිංහල රජ පෙළපතේ අවසන් පාලකයා

B.කන්නසාමි කුමරුට උඩරට රාජ්‍යත්වය ලබා ගැනීමට සහාය දුන් ප්‍රභූවරයා

C .අදිකාරම්වරුන් ගේ පණිවිඩය ප්‍රාදේශීය නිලධාරීන් වෙත ගෙන ගිය පුද්ගලයා.

D.පෘතුගීසීන් විසින් තමන්ට ගැති පාලකයෙකු ලෙස පළමු වරට උඩරට ප්‍රදේශය පාලනය සඳහා පත් කළ පුද්ගලයා.

(ජයවීර බණ්ඩාර, ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ,වීරසුන්දර බණ්ඩාර, යමසිංහ බණ්ඩාර,කටුපුල්ලේවරු, පිළිමතලව්වේ අදිකාරම්, විදානේවරු) (ලකුණු 4)

III.උඩරට රාජධානිය සම්බන්ධයෙන් ලන්දේසීන්ගේ ප්‍රතිපත්තියේ කැපී පෙනුනු ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 5)

IV.සීතාවක රාජධානියේ බල වර්ධනයට මෙන්ම බිඳ වැටීමට ද පළමුවන රාජසිංහ රජුගේ ක්‍රියා කලාපය බලපෑ බව කරුණු තුනක් මඟින් විස්තර කරන්න. (ලකුණු 6)

6)

I.දාහත්වන වන සියවස අග භාගය වන විට ඉන්දියාව තුළ,

A- ඉංග්‍රීසීන් විසින් පිහිටුවා ගත් වෙළෙඳ මධ්‍යස්ථාන දෙකක් ද,

B- ප්‍රංශ ජාතිකයන් විසින් පිහිටුවාගත් වෙළඳ මධ්‍යස්ථානයක් ද ලියන්න.

(ලකුණු 3)

II.1803 ඉංග්‍රීසීන්ගේ උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 4)

III.1818 නිදහස් සටන සඳහා බලපෑ ප්‍රධාන හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 5)

IV.1848 නිදහස් සටන ආරම්භ වීම කෙරෙහි බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 6)

7)

I.බ්‍රිතාන්‍යයන් යටතේ කෝපි වගාව ව්‍යාප්ත වූ ප්‍රදේශ තුනක් නම් කරන්න. (ලකුණු 3)

II.කෝපි වගාවේ පරිහානියට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 4)

III.තේ වගාවේ දියුණුවට බලපෑ සාධක දෙකක් විස්තර කරන්න. (ලකුණු 5)

IV.වතු වගාව හඳුන්වා දීම නිසා මෙරට ආර්ථිකයට සිදු වූ හිතකර හා අහිතකර බලපෑම දෙක බැගින් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 6)

## III කොටස

8)

I. පුනරුද සමයේ, කතෝලික සභාවේ දුර්වලතා විවේචනයට ලක්කළ පුද්ගලයන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 3)

II.

A පෙරදිගට පැමිණීම සඳහා නව වෙළඳ මාර්ග සොයා ගැනීම කෙරෙහි යුරෝපා ජාතීන් පෙළඹීමට බලපෑ හේතු දෙකක් හා

B ඒ සඳහා උපකාරී වූ නව සොයා ගැනීම් දෙකක් නම් කරන්න. (ලකුණු 4)

III. පුනරුදයේ ගෝලීය ප්‍රවණතාව කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 5)

IV. පුනරුදය නිසා ලෝක දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම් තුනක් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 6)

9)

I. කාර්මික විප්ලවය ප්‍රධාන කර්මාන්ත තුනක් ඇසුරින් සිදුවිය. එම කර්මාන්ත තුන නම් කරන්න. (ලකුණු 3)

II. දහනමවන සියවසේ දී වෙනත් රටවලට කාර්මීකරණය ව්‍යාප්ත වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 4)

III. කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ වෙනත් ක්ෂේත්‍ර දෙකක් ලියා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

IV. කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑ ආකාරය නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | විෂයය – ඉතිහාසය | පිළිතුරු පත්‍රය |
|---|---|---|

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1). | I | 11). | II | 21). | IV | 31). | III |
| 2). | I | 12). | III | 22). | II | 32). | II |
| 3). | II | 13). | I | 23). | III | 33). | II |
| 4). | III | 14). | I | 24). | I | 34). | I |
| 5). | II | 15). | III | 25). | IV | 35). | II |
| 6). | IV | 16). | II | 26). | IV | 36). | I |
| 7). | II | 17). | IV | 27). | II | 37). | I |
| 8). | III | 18). | II | 28). | I | 38). | I |
| 9). | IV | 19). | III | 29). | I | 39). | I |
| 10). | I | 20). | II | 30). | II | 40). | III |

## II පත්‍රය

### I කොටස

01. (ආ). I). A - කොණ්ඩවට්ටුවාන් සෙල් ලිපිය

B - ඌරා කැට ලිං

C - ලංකා ජාතික සංගමය

D - හත්වන බුවනෙකබාහු

II). 1. පොලොන්නරුවේ ශිව දේවාලය

2. පොලොන්නරුව

3. කලුගල්

4. හින්දු

III). 1. ඩී. එස්. සේනානායක

2. ඉඩම් හා කෘෂිකර්මාන්ත

3. එක්සත් ජාතික පක්ෂය

4. ගල්ඔය

## II කොටස

02. I. මිනිහාගල්කන්ද, බූන්දල, පතිරාජවෙල, බෙල්ලන්බැඳි පැලැස්ස, බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න

II. ආහාර හා ස්වභාවිත සම්පත් බහුල ප්‍රදේශ

ජලය පහසුවෙන් ලබාගත හැකි ස්ථාන

ගල් මෙවලම් ලබා ගැනීමට පාෂාණ වර්ග බහුල ප්‍රදේශ

ගල් ගුහා සහිත ප්‍රදේශ (වර්ෂා සහිත ප්‍රදේශ)

එලිමහන් ස්ථාන

III. ලෝහ තාක්ෂණය / මැටි භාණ්ඩ නිපදවීමේ තාත්ෂණය / නිවාස ඉදිකිරීමේ / පබලු නිපදවීම / ආභරණ නිපදවීම / සුසාන ඉදි කිරීම.

IV. වාර්ෂික වර්ෂාපතනය

භූ විෂමතාව

ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය

පසේ ස්වභාවය

ජලවහනය

03. I. A - කිරිඳි ඔය - මාගම B - මල්වතු ඔය - අනුරාධපුර C - මහවැලි ගඟ - පොලොන්නරුව

II. A - සකපෝරුව B - ජ්‍යාමිතික ක්ෂුද්‍ර මෙවලම් C - රළපනාව D - වජ්‍ර චුම්බර

III. කෘෂි කාර්මික කටයුතු සඳහා ජලය සැපයීම.

ගංවතුර පාලනය

නාගරික ජනතාවගේ ජල අවශ්‍යතා සපුරා ගැනීම.

වැඩිවන ජනගහනය අනුව ආහාර නිපදවීමට අවශ්‍ය ජලය ලබා ගැනීම.

නියං කාලවලදී ජල අවශ්‍යතා සපුරා ගැනීම.

අලංකරණය සඳහා

පොකුණුවල ජලය සපයා ගැනීමට.

වර්ෂාවේ අවිනිශ්චිත බව.

IV. A. පිටවාන -

ගල්කුට්ටි සියුම් ලෙස එකිනෙකට තදවන සේ සකස් කරමින් වැවක කෙලවර වැව් බැම්මට පහලින් ඉදිකර තිබීම හා සමහර වැව්වල ස්වභාවිකව පිහිටි ගල්තලා උදව් කර ගැනීම.

උදා - කලා වැවේ පිටවාන, පරාක්‍රම සමුද්‍රයේ පිටවනා

කාර්යය - වැව් බැම්මට හානියක් නොවන පරිදි වැවේ ජලය පිටවීම.

B. සොරොව්ව -

නිර්මාණය - විශාල ගල් පතුරු, පිලිස්සු ගඩොල් යොදා ගනිමින් වැව් බැම්මේ නිශ්චිත උසකින් විවරයක් ලෙස නිර්මාණය කෙරේ.

විශාල වැව්වල ගෙඩ සොරොව්ව හා මඩ සොරොව්ව ලෙස දක්නට ලැබීම.

කාර්යය - ප්‍රධාන ඇලට ජලය නිකුත් කිරීම. - ගොඩ සොරොව්ව

රොන්මඩ ඉවත් කිරීම. - මඩ සොරොව්ව

C. බිසෝ කොටුව -

ගල් පතුරු යොදා ගනිමින් ආංයත චතුරස්‍රාකාර ආකාශයක් ලෙස නිර්මාණය කෙරේ.

කාර්යය - ජය ප්‍රධාන ඇලට නිකුත් කිරීමේදී ඇතිවන පීඩනය අවම කරමින් ජලය මුදා හැරීම.

D. - වැව් බැම්ම -

නිර්මාණය - කුඩා කඳු ගැට දෙකක් යා කොට නිමවා තිබීම.

කඳු ගැට නොමැති අවස්ථාවලදී චාපාකාර ලෙස වැව් බැම්ව නිමවීම. උදා - යෝධ වැව

පස්, මැටි, බෙතිල, කිරිමැටි ආදිය යොදාගෙන ඉතා තදින් තබා බැම්ම නිර්මාබය කිරීම.

ඇතැම් අවස්ථාවල වැව් බැම්ම සඳහා පිහිටි ගල් යොදා ගැනීම. උදා - සොරබොර වැව

ක්වාට්න් ස්ථර වැනි බැම්ම ඉදිකිරීමේ දී සැලකිල්ලට ගැනීම. උදා - මින්නේරිය

04. I. රටේ ආර්ථික දියුණුව

වැව් අමුණු ඉදිකර ආර්ථික ශුභ සිද්ධිය ඇති කිරීම.

රට වැසියනට ආරක්ෂාව සැපයීම.

පරසතුරු උවදුරු වලින් රට ආරක්ෂා කිරීම.

රට වැසියාගේ අධ්‍යාත්මික සංවර්ධනය ගොඩ නැංවීම.

වෙහෙර විහාර ඉදිකරමින් අධ්‍යාත්මකි සංවර්ධනය ඇති කිරීම.

II. ජල සංරක්ෂණය

ඇල දෙපස භූමියේ තෙතමනය ඉහළ දැමීම තුලින් භෝග වගාව වැඩි දියුණු කිරීම.

III. ශ්‍රී මහා බෝධි රෝපන අවස්ථාවේ කාජරගාම හා චන්දන ග්‍රාමයේ ක්ෂත්‍රියයන් ආරාධන කිරීම.

ශ්‍රී මහා බෝධි ශාකා දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීම.

අශෝක අධිරාජ්‍යය විසින් එවන ලද පංචකකුද භාණ්ඩ භාවිතා කොට නැවත අභිශේකය ලැබීම.

දෙවනපිය අභිධානය භාවිතයට ගැනීම.

IV. සිත්තාරු බිම බුදල්නාගනෙ උපකාර ලබාගෙන සේනා සංවිධානය කිරීම.

තෙවරක් අනුරාධපුරය ආක්‍රමණය කොට අවසාන කොට අවසාන සටනේ දී චෝලයන්ගෙන් අනුරාධපුර රාජධානිය මුදා ගෙන නැවත රට එක්සේසත් කිරීම.

පාලන මධ්‍යස්ථානය පොලොන්නරුවට මාරු කිරීම.

බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම.

05. (i). කන්දෙනුවර / උඩරට රාජධානිය / ශ්‍රී වර්ධනපුරය / සෙංකඩගල

(ii). A - ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ B - පිළිම තලාවේ

C - කටුපුල්ලේ වරු D - යමසිංහ බණ්ඩාර

(iii). ගැටුම්වලින් වැලකී උඩරට සමග සාමකාමීව කටයුතු කිරීමට උත්සාහ කිරීම

උඩරට රජුගේ හොඳහිත දිනා ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

(රජුට තෑගි භෝග ලබාදීම. රජු හමුවීමට දූත පිරිස් යැවීම. රජු සමග ලිපි හුවමාර කර ගැනීම.)

උපසම්පදාව ගෙන ඒම සඳහා උඩරට රජවරුන්ට නැව් සපයාදීම.

උදා - දෙවන විමලධර්මසූරිය රජු, කීර්ති ශ්‍රී රාජසිංහ රජු, ශ්‍රී විජය රාජසිංහ වැනි රජවරුන්ට නැව් ලබාදීම.

(iv). <u>බලය වර්ධනයට</u>

මුල්ලේරියා සටනේ දී පෘතුගීසීන් සමූල ඝාතනය කිරීම තුළින් පෘතුගීසීන්ගේ බලය අඩපන කිරීම.

වීරසුන්දර බණ්ඩාරගේ සහාය ලබා ගනිමින් උඩරට රාජධානිය අත්පත් කරගෙන කෝට්ටේ බල ප්‍රදේශය පුළුල් කර ගැනීම.

<u>පරිහානියට බලපෑ හේතු</u>

සීතාවක පාලකයන් නිරන්තර යුද්ධයක පැටලීම නිසා ආර්ථික සංවර්ධනය බිඳ වැටීම.

රාජසිංහ රජු අවසන් කාලයේ දී අනුගමනය කර බෞද්ධ විරෝධී ප්‍රතිපත්තිය

උඩරට යටත් කර ගැනීමේ දී උදව් කල වීරසුන්දර බණ්ඩාර ඝාතනයට ලක්වීඹ නිසා උඩරට ජනතා සහාය නොලැබීම.

රාජසිංහ රජුගෙන් පසු සීතාවක රාජධානියට නිසි උරුමකරුවකු නොසිටීම.

06. I. A - මධුරාසි / බොම්බාය / කල්කටා

B - පොණ්ඩිචේරි / කාරිකාල් / චන්ද්‍රනගර්

II. වැසි සමය එළැඹීමත් සමග සැපයුම් මාර්ග අවහිර වීම.

පහතරට හා උඩරට අතර සැපයුම් මාර්ග උඩරැටියන් විසින් අවහිර කිරීම.

උඩරට පිළිබඳ නිවැරදි අවබෝධයක් ඉංග්‍රීසීන්ට නොතිබීම.

කන්ද උඩරට පිරිස රාජ්‍යය ආරක්ෂා කිරීම.

III. නිදහස අහිමිවීම හා රජෙකු නොමැතිවීමේ කනස්සල්ල

ආගම හා සංස්කෘතිය ආරක්ෂා කිරීම පිළිබඳ ගැටලු මතුවීම.

උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම.

IV. රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය

ගම් සභා අඩපණ වීම.

කෝල්බෲක් හඳුන්වා දුන් නව අධිකරණ ක්‍රමය

(මේවා විස්තර විය යුතු ය.)

07. I. දුම්බර මිටියාවත, ගම්පොල, පේරාදෙණිය, මාතලේ

II. ලන්ඩන් වෙළඳපොලේ ශ්‍රී ලංකාවේ කෝපි සඳහා ඉල්ලුම අඩුවීම.

ලෝක ආර්ථිකය පරිහානිය

කෝපි කොල රෝගය පැතිරීම.

කෝපිවලට වඩා තේ වගාව ලංකාවේ සාර්ථක වීම.

III. වියළි කලාපය හැර මෙරට සෙසු ප්‍රදේශවල වගාව සාර්ථක වීම.

ලෝක වෙළඳපලේ මෙරට තේ සඳහා ඉල්ලුම වැඩිවීම.

ගුණාත්මක තේ නිෂ්පාදනය කළ හැකිවීම.

ලාභදායී ශ්‍රමය

මාර්ග පහසුකම් දියුණුවීම නිසා පරිවහනය පහසුව

තේ වගාව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම.

තේ වගාව සඳහා විදේශීය ආයෝජකයන් පැමිණීම

යටිතල පහසුකම් දියුණු වීම.

IV. <u>හිතකර බලපෑම්</u>

අපනයනය, වැවිලි භෝග හඳුන්වා දීම.

වර්තමානයේත් ප්‍රධාන ආදායමක් වීම.

වෙළඳාමේ දියුණුව

වතු වගාව ආශ්‍රයෙන් විවිධ ව්‍යාපාර වර්ධනය (නිවාඩු නිකේතන, සමාජශාලා, ආපනශාලා, රෙදිපිළි කර්මාන්තය, රැකියා බිහිවීම.)

<u>අහිතකර බලපෑම්</u>

දේශීය කර්මාන්ත පිරිහීම.

මුදල් මත සියල්ල තීරණය වීම.

ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම.

රටේ බහුතර ජනතාවක් දුප්පත් වීම.

මත්ද්‍රව්‍ය, මත්පැන් භාවිතය ප්‍රචලිත වීම.

## II කොටස

08. I. ජෝන් වයික්ලිස් / ජෝන් හස් / ඉරාස්මස් / මාටින් ලූතර් කින්

II. A. ජාතික රාජ්‍යයන් අනුග්‍රහ දැක්වීම. ඒ යටතේ කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරු අල්ලා ගැනීමත් සමග පෙර අපර දෙදිග වෙළඳාමට බාධා ඇති වීම.

යුරෝපයේ පැවති ආගමික ගැටුම්

B. මාලිමා යන්ත්‍රය නිපදවීම.

උතුරු තරු මාපකය නිපදවීම.

ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම.

ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම.

III. දේශගවේශන නිසා නව රටවල් සොයා යෑම.

ආසියා/අප්‍රිකා හා ඇමරිකා මහද්වීපවල යුරෝපා බල ව්‍යාප්තිය ඇතිවීම.

යුරෝපා චින්තනය ලෝකය තුළ ව්‍යාප්ත වීම.

IV. <u>දේශපාලන ක්ෂේත්‍රය</u>

ජාතික රාජ්‍යයක් බිහිවීම.

නව මධ්‍යම පන්තියක් බිහිවීම.

ඉඩම් හිමි වංශාධිපතිවරුන්ගේ බලය බිඳ වැටීම.

රජු පාලන කටයුතුවලදී වැදගත් වූ අතර සියලු බලතල රජු වටා කේන්ද්‍රගත වීම.

09. I. පේෂ කර්මාන්තය, ගල් අඟුරු කර්මාන්තය, යකඩ හා වානේ

II. ජනගහන වර්ධනය නිසා භාණ්ඩවලට තිබූ ඉල්ලුම ඉහළ යෑම.

යුරෝපය තුළ ගමනාගමනය හා ප්‍රවාහන කටයුතුවල වර්ධනය

III. කෘෂි කර්මාන්තය, ප්‍රවාහනය, සන්නිවේදනය

IV. බැංකු ආරම්භ වීම.

මැකඩම් ක්‍රමය හඳුන්වාදීම.

මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉදිකිරීම.

තැපැල් සේවය ආරම්භ වීම.

LOL.lk
**BookStore**

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**